# Sirilaka Kadaim Pota

## ශ්‍රී
## ලඞකානගරග්‍රාම විභාගය

හෙවත්

## සිරිලක කඩඉම් පොත.

---

පෞරාණික

ගිරිතලාකණ තෙරිඳුන් විසින් ලියන ලදී.

---

කේ. ඇම්. ඇස්. ද සිල්වා විසින්

සකස්කොට

අළුත්ගම

සද්ධර්මප්‍රකාශ යන්ත්‍රාලයෙහි මුද්‍රාඞ්කනය

කරවන ලදී

---

2460

---

1916

මිළ ශත 25 යි. Price 25 Cents.

## ශ්‍රී ලඞ්කා නගරග්‍රාම විභාගය

හෙවත්

# සිරිලක කඩඉම් පොත.

## නමව් මුනි සරණ.

කෘතයුගය, ත්‍රේතායුගය, ද්වාපරයුගය, කලියුග යයි යුග සතරක් වෙති. මේ යුග සතරින් ත්‍රේතා යුග යේදී පුලස්තිහට දකොට අසුරකන්‍යාවවැදූ රාවණ නම් රජ්ජුරුවෝ රාජ ධර්ම්ය වරදවා ලෝසතුන් රක් මස් නොකොට දෙවියන් බුදුන් තපස්වරයන් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ආදින්ට ගරු නොකොට අය ගනිමින් කඳමුලපව්තයෙහි වසන තපස්විවරයින් පසේබුදුන් ආදීන්ගෙන් දක්වා 'කිසියම්දෙයක් නෙණෙව'යි කියා අයපඩුරු ගණිමින් ලංකාරාජ්‍යයෙහි එක්සියයක්රාජ ධානි ඇති කරවා දඹදිව රජුන් සේවක කොට දෙවු ලොව අසුරලොව ගරුඩලොව නාගලොව රජුන් සිර ගෙයිලා ඔවුන්ගෙන් අයබදු ගණිමින් චන්ද සූර්‍ය්‍යාදි රජග්‍රහයන්බැඳ සිරකොට ඔවුන් අනින්ද මෙහෙගණි මින් සිටියේය. ඔහුගේ නුවර උඩින් සඳහිරු දෙදෙනා ආලොක පතුරුවා ඉවතින් යන්නාහ. මෙසේ තමන් පෙර සිල්රක්‍ෂාකලපිණින් දෙවියන්ගෙන්ලත්වරමින් දසහිස්රාවණායයි ප්‍රසිඬව මෙරසතර මුහුසතර මහා වීපය හා දෙවුලොව නාලොව අසුරලොව ගරුඩලොව බඹලොව ආදී සෑමතැන්වලට අධර්මයෙන් චක්‍රවර්ති රජකරන රාවණ නම් රජ්ජුරුවෝ ශ්‍රීලඞ්කාපුරයහි නුවරක්කරවා මේලෝකයෙහි ඇති යම සියලු රත්න

සමාධ කොට උයන් පොකුණු ළින් පතැස් පුෂ්පාරාම ඵලාරාම පවුරුපදනම් අට්ටාල වෙට්ටාල ළමින් අගල් සෑඩිමත් ඇත් අස් රථ වාහන මාලිගා මණ්ඩප ආදීවූ සියලු සැපතින් යුක්තව චක්‍රවර්තීව එක්සියයක් රජුන්හා සමග රජකරන රාවණ නම් රජුට ශීතා නම් අග්‍ර දේවින් සිරකොට කරන ලද අධර්මය නිසා රාම නම් රජු විසින් යුධකොට රාවණා මරවා ඔහුගේ නුවර හා රට භාගයක් මුහුදටගිලීගොස් ඉතිරිවූ ලක්දිව රාමනම්රජු විසින් විභීෂණයන් අරක්ගෙණපවත් වසිකියාසලස්වනලද මේශ්‍රීලඞ්කාව දෙවරක් රාවණා අධර්මයෙන් රට කල හෙයින් අනාථවිය. ඉතිරිව තුබූ ශ්‍රී ලඞ්කා විංශ කකුසඳ කෝණාගම කාශ්‍යප යන තුන් බුදුන් කාලයෙහි වෙන වෙන නාමගොත්‍ර වෙයි. අප බුදුන් සමයෙහි පළමු මහමෙවුනා උයන්මැද දෙලොස් යොදුන් නුවරක් වෙයි. ඒ නුවර යක්ෂයන්ට වාසස්ථානවෙයි. ඒනුවරට වැඩ යක්ෂයින් දුරුකොට ලක්දිව මහියංගනකුට පර්වතයෙහි සමනලවාසීන සමන් දෙවියන් හට කෙස ධාතු මිටක් දෙවා 'දෙව්රජ, මයියන් කරව'යි වදාල බැවින් මයියඞ්ගණ යයි නම්ලද. පසුව දෙවරක් මයියන් කරවන ලද්දේය.

තවද අප බුදුන් දෙව්රම් වෙහෙර වැඩවසන සමයෙහි චූලෝදර මහෝදර දෙමයිල් නාරජුන් දෙදෙනෙක් මිණිපලඟක් නිසා ඝොරවූ විෂ යුධයෙන් නස්නාබොහෝනයින්කෙරෙහිකරුණාකොට තමන් වහන්සේගේ බුඩානුභාවයෙන් සමගිකරවා ඔවුන් විසින් පිළිගන්වනලද මිණිපලගමන්තෙහි වැඩහිඳ බණවදාරා වැඩිසේක.

මේ ශ්‍රීලංකාවීපයෙන් එක්දහස් දෙසිය අසූවක් ගවු රාවණානම් රජ්ජුරුවන් අයාමෙහි මුහුදගිලෙන

සමයෙහි බුදුන්ගේ එක් සිද්ධස්ථාන භූමි දානයෙක් හෙයින් එහි වසන්නාවූ **මහෝදර නම්** දිව්‍ය නාග රාජයන්ගේ ආනුභාවයෙන් මුහුදු නොගිලී අටපණස් යොදුන් තැන් ඉතිරිවිය. වඩිනා බුදුන් කැටුව සෙවන කොට වැඩිය **කිරිපලුබෝධිය** හා **සමිද්ධිසුමන** දෙවු රජ හා **රාජායතන** චෛත්‍යය පිහිටි හෙයින් **නාග දිවයින** යයි ප්‍රසිද්ධවිය මේ දිවයින, **සිංහල රාජ්‍යයට** ඇතුළත්වූ දිවයිනය. සොළිරට **කාවේරිපට්ටණ** නම් නුවර හා **රාවණ** නම් රජුගේ **ලංකාපුරපට්ටණ** නම් නුවර හා ලෝපවුරු සහසින් හෙබියාවූ සතරගව්වූ පමණ පළලවූ අගල ලවණ සාගරයට කැප්පූ හෙයින් දෙකොණ ලවණ සාගරයෙන් දිය උතුරුවා දෙවියන්ගේ ආනුභාවයෙන් ලංකාපුර නුවර හා සම අට පණස් යොදුන් පළලින් මුහුදුවීයයි දතයුතු.

තවද අප බුදුන් තුන්වන ගමනේ වඩිනා දින යෙහි **කැලණිගම** හා **සමිද්ධ** නම් ගඞ්ගාවට හා **මක් කමට** හා මෙකී ස්ථානයන්ට වැඩ ශ්‍රීපාද පද්ම ලාඤ්ඡනය කරමා **සමනකූට** මස්තකයෙහි **ශ්‍රීපාදය** පිහිටුවමා වැඩි හෙයින්ද, **කැලණිතිස්ස** නම් රජු නිරපරාධ රහත් නමකට කළාවූ **තෙල්කටාර** අපරාධයට මහමුහුද උතුරුවන්නා **මාකරයින්** බොහෝ තැන් හා **රුහුණුපුරයින්** කාලක් හා ඇතුළත් කොට මුහුදු දිය උතුරුවන්නාවූ සිංහලවිපත්තියන් එක්තරා රටක් **මුල් ගිරිගල** පටන් එක දුමෙන් **උපසිකාගන්ද** නම් කඩඉම් පර්වතයෙන්මත්තේ දකුණුදිග්භාගය සිසැදි පවුණු ගම්දසයක්හු මුදුනෙහි සිට වූ සිංහලරටහැර තොක් යතාලද තුන්සියසැටක්දිවයින් හා පුළුලින් සතවූ වක් හා දිගින් **පණස්** ගව්වෙක් මුහුදු ගිලුනේය. සාගල නුවර **මිලිඳු රජ** බමුණකු තිවරදමේ මැරූ හෙයින් **බැමිණිවිසාගෙන්** බොහෝ රට ටමණක් ඉතිරිව

ශ්‍රී

# ලංකානගරග්‍රාම විභාගය.

---

නාමැති මේ පොත කියවීමෙන් අනායනා "ලෙවනි නාසික" ග්‍රන්ථයකින් නොදතහැකි "ශ්‍රී ලංකාද්වීපය" පිළිබඳ නාගරග්‍රාම විස්තරාදිය හා රාවණාසම්මයෙහි හොරඛුරුද මනාසේ දතහැකිවේ

එබැවින් "ලක්සිකාස" නරැක සකල සාධුජනයින් එක එක පොත බැගින් පරිශීලනය කරත්වා

මීට

K. M. S. De Silva